WWW.OLEVELAPI.COM

OL/2024(2025)/33/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S II

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ඉතිහාසය	**II**
வரலாறு	**II**
History	**II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

* **I කොටසේ** ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
* **II කොටසින්** ප්‍රශ්න **හතරකට** ද, **III කොටසින්** ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

I කොටස

1. (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

වළවේ ගඟ, මහවැලි ගඟ, හුරුළු වැව, රන්දෙණිගල ජලාශය, මින්නේරිය වැව, මිහිහාගල්කන්ද, මාතොට, මහනුවර, පේදුරුතුඩුව, පුත්තලම, සීතාවක, කොඩඩියාර් කොටුව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

ජර්මනිය, ලිස්බන්, මලය අර්ධද්වීපය, මදුරාසිය, නාගසාකි, උතුරු මුහුද (ලකුණු 06 යි)

(ආ) (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - අතීතයේ මැටි බඳුන් සැකසීම සඳහා භාවිත කළ සරල යන්ත්‍රය කුමක් ද?
B - අනුරාධපුර රාජධානියේ ප්‍රථම රජතුමා කවුරුන් ද?
C - ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලද්දේ කවුරුන් විසින් ද?
D - පළමුවන ලෝක යුද සමයේ දී ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමූ මගී නෞකාව කුමක් ද? (ලකුණු 04 යි)

WWW.OLEVELAPI.COM

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. එය හමුවී ඇති ස්ථානය කුමක් ද?
3. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?
4. එය අයත් වූ ඓතිහාසික යුගය කුමක් ද?



A

(ලකුණු 04 යි)

[දෙවැනි පිටුව බලන්න.


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

2. එය පිහිටි නගරය කුමක් ද?

3. මෙම ගොඩනැගිල්ල භාවිත කරන ලද්දේ කුමක් සඳහා ද?

4. එය හා සම්බන්ධ විප්ලවය කුමක් ද?



B

(ලකුණු 04 යි)

II කොටස

2. (i) පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප භාවිත කළ රජවරු *A*, *B* හා *C* යටතේ **අනුපිළිවෙළින්** දක්වන්න.

A - දේවත්ව

B - පර්වතරාජ

C - චක්‍රවර්ති (ලකුණු 03 යි)

(ii) අතීතයේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පැරණි රජවරුන් විසින් තමාගෙන් රටවැසියාට ඉටුවිය යුතු යැයි සැලකූ යුතුකම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පළමුවන විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) අතීත ශ්‍රී ලංකාවේ රජවරු සම්බන්ධතා පවත්වා ගත් විදේශ රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීත රජවරු විදේශ සබඳතා පවත්වා ගත් ආකාර **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ ආගම් පැවති බව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ වෘත්තිකයින් සිටි බව නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) පහත සඳහන් රාජධානිවල ආරම්භක පාලකයින් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා ඔවුන්ගේ නම් *A*, *B* හා *C* යටතේ **අනුපිළිවෙළින්** ලියන්න.

A - දඹදෙණිය

B - කුරුණෑගල

C - කෝට්ටේ

(II බුවනෙකබාහු, III විජයබාහු, VI පරාක්‍රමබාහු, III වික්‍රමබාහු) (ලකුණු 03 යි)

WWW.OLEVELAPI.COM

(ii) දෙවන නාගරීකරණ අවධියේ රචනා වූ සංදේශ කාව්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ අවධියේ පැවැති වෙළෙඳාමේ ස්වභාවය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ අවධියේ ගෘහනිර්මාණ ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

5. (i) 18 වන සියවසේ යුරෝපයේ ඉහළ ඉල්ලුමක් තිබූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ද්‍රව්‍ය **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) 1818 දී උඩරටියන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව නැගී සිටීමට තුඩුදුන් හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) 1818 නිදහස් අරගලය අසාර්ථක වීමට තුඩුදුන් හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

6. (i) හින්දු ආගමික පුනරුදයේ නායකයින් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා එහි නායකයින් ගත් ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රිස්තියානි මිෂනාරිවරුන් ශ්‍රී ලංකාවේ තම ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බෞද්ධාගමික පුනරුදය උදෙසා එහි නායකයින් අනුගමනය කරන ලද උපායමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

7. (i) නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ගොවි ජනපද **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) ගොවි ජනපද පිහිටුවීමේ දී මුහුණදුන් අභියෝග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහවැලි සංවර්ධන ව්‍යාපාරය බහුකාර්ය යෝජනා ක්‍රමයක් ලෙස සැලකීමට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

III කොටස

8. (i) යුරෝපයේ පුනරුද සමයේ විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ තැනැත්තන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත **8** (i) ට අදාළව ඔබ නම් කළ තැනැත්තන් දෙදෙනෙකු ඉදිරිපත් කළ නව මත **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පුනරුද සමයේ කලාශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදයේ ප්‍රතිඵල ලෙස යුරෝපයේ ඇති වූ දේශපාලන හා ආර්ථික වෙනස්වීම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) පළමුවන ලෝක යුද්ධයේ දී ජයගත් පිලට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පළමුවන ලෝක සංග්‍රාමය ඇතිවීමට ජර්මනියේ ක්‍රියාකලාපය හේතු වූ බවට කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන ලෝක සංග්‍රාමයෙන් මිත්‍ර පිල ජයගැනීමට මුල් වූ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


33 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ඉතිහාසය II
வரலாறு II
History II

විභාග අංකය .....


1. (අ) (i)



[අනෙක් පිටුව බලන්න

අපොස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. (අ) (ii)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...